## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

### බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
### බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2024

## <u>වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව</u>

### <u>ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්</u>

(අ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් තුනක් එක් වතාවකදී සමත් වීම.

හෝ

(ආ) වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධියට අදාළ පරීක්ෂණ සඳහා බාහිර අපේක්ෂකයන් ලෙස ලියාපදිංචි වීම පිණිස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් මතු දැක්වෙන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

i. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වාණිජ්‍යය පිළිබඳ විශේෂ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම.

ii. ලන්ඩනයේ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

iii. ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී තිබීම.

iv. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දෑ අවුරුදු ජාතික සහතිකය ලබා තිබීම.

v. ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරීන්ගේ අවසාන පරීක්ෂණයෙන් සමත් වී රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වී තිබීම.

vi. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

vii. ශ්‍රී ලංකාවේ/ එක්සත් රාජධානියේ ගණකාධිකරණ ශිල්පීය ආයතනය පවත්වන විභාගයේ (AAT) සියලුම කොටස් සමත් වී සිටීම.

viii. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ ඩිප්ලෝමාව ලබා තිබීම.

ix. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ පරීක්ෂණවල දෙවන අදියර සමත් වී තිබීම.

x. එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය සමත් වී සිටීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා සිටීම.

හෝ

(ඈ) ඉහත සඳහන් සුදුසුකම්වලට හෝ අවශ්‍යතාවලට හෝ සමාන සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවිද්‍යා අධ්‍යයනාංශ බාහිර විභාග කමිටුව සහ සනාතන සභාවේ පිළිගත් සුදුසුකමක් ලබා සිටීම.

බාහිර අපේක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සෑම අයදුම්කරුවකුම/ අයදුම්කාරියක්ම එකී අධ්‍යයන වර්ෂයේ ජනවාරි මස 01 වන දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.

## පාඨමාලාවේ ගාස්තු

වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ගාස්තු පහත පරිදි වේ.

| ගාස්තුව | මුදල (රුපියල්) | ගෙවිය යුතු කාල සීමාව |
|---|---|---|
| පාඨමාලා ගාස්තු පළමු වාරිකය | 50,000.00 | ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු දෙවන වාරිකය | 100,000.00 | උපාධි I පරීක්ෂණයට අයදුම්කිරීමට පෙර ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු තෙවැනි වාරිකය | 50,000.00 | උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ගෙවිය යුතුයි. |
| පාඨමාලා ගාස්තු සිව්වැනි වාරිකය | 50,000.00 | |

පාඨමාලා ගාස්තු අයකරනුයේ සම්පූර්ණ උපාධි පාඨමාලාව වෙනුවෙනි. උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවීම අනිවාර්ය වන අතර උපාධි II පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර තෙවැනි වාරිකය සහ සිව්වැනි වාරිකය ගෙවීම අනිවාර්ය වේ.

## ලියාපදිංචිය සඳහා තෝරා ගැනීම

වාණිජවිද්‍යා අධ්‍යයනාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයකට අනුව සුදුසුකම් ඇති අයදුම්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ.

## උපාධි පාඨමාලාවේ මාධ්‍යය

**වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය හැකිය. ඔබ විසින් වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් යොමුකරන අවස්ථාවේදී පාඨමාලා මාධ්‍ය තෝරා ගත යුතු වේ. ඉන් පසුව කිසිඳු හේතුවක් මත පාඨමාලාවේ මාධ්‍ය වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.**

## විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම

වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ උපාධි I, II සහ III කොටස් සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලබයි. එම දේශනවලට සජීවී ලෙස සහභාගී වීම අත්‍යවශ්‍ය වන අතර, පසු භාවිතය සඳහා අදාල පටිගතකල දේශන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙහි **(LMS)** අදාල විෂය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

## උපාධි පරීක්ෂණ සඳහා පෙනී සිටීම

සම්මන්ත්‍රණ අවසන් වූ පසු පරීක්ෂණ සඳහා www.external.sjp.ac.lk **වෙබ් අඩවිය ඔස්සේ පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. **පාඨමාලා ගාස්තු නියමිත පරිදි ගෙවා පරීක්ෂණයට අයදුම් කළ අයට පමණක්** විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

** **පාඨමාලා ගාස්තු වාරික ගෙවීම්, සම්මන්ත්‍රණ කාලසටහන්, විභාග කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර සහ සියලුම විස්තර** www.external.sjp.ac.lk **වෙබ් අඩවිය ඔස්සේ පමණක් නිකුත් කෙරේ.**

**දිනපතා www.external.sjp.ac.lk වෙබ් අඩවිය පරිශීලනය කිරීම අනිවාර්ය වේ.**

**තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ.**

## ලියාපදිංචිය අවලංගු කිරීම

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමඟ ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී මුදල් නැවත ගෙවීමක් සිදු කරනු ලබන්නේ පහත සඳහන් හේතූන් වලට පමණි.

a) **ලියාපදිංචි වූ දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම්** සඳහා පමණක් ගෙවන ලද පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ. **මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

b) යම් අයකු බාහිර උපාධි පාඨමාලාවකට ලියාපදිංචි වී **ප්‍රථම වසර පරීක්ෂණය පැවැත්වීමට පෙර, රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයකු වශයෙන් ලියාපදිංචි වුවහොත්** ගෙවන ලද පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන ඉතිරි මුදල් ආපසු ගෙවනු ලැබේ.

## අයදුම්පත් යොමු කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු

1. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව www.external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය. **මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්කරන ලද උපාධි පාඨමාලාව ඉන් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.**

2. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත (Submit) කළ යුතුය.

   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට ගෙවන ලද **රු.3,000/-** මුදලට අදාළ රිසිට්පතේ පිටපත (Customer Copy) හෝ VISA හෝ Master (debit/credit) කාඩ්පත් මඟින් ගෙවීම් කරන්නේ නම් ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක්. (Online receipt)

3. ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පත (Hard copy) පහත සඳහන් ලිපිනයට 2024.08.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
**(සැ.යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය.)**

**අයදුම්පත යොමු කළ යුතු ලිපිනය :** නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
තැ. පෙ. අංක 10
ගංගොඩවිල
නුගේගොඩ

4. ඔබ විසින් වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ ගිණුම් අංකයට **072010007036** **පමණක් බැර වන පරිදි** දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදලින් ගෙවීම හෝ ඕනෑම VISA හෝ Master (debit/credit) කාඩ්පත් මගින් රු. 3000/- මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට් පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. **ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවේ ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ. (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් සහ ඔබ VISA හෝ Master (debit/credit) කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම්** ගෙවීම් කල බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt) ළඟ තබා ගත යුතුවේ.)

අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස (උ/පෙළ) සහතිකය පිළිගනු ලබන්නේ පහත සඳහන් එක් ක්‍රමයක් යටතේ ඉදිරිපත් කළහොත් පමණි.

- පාසලේ ලිපි ශීර්ෂය යටතේ **විදුහල්පතිගේ අත්සනින් නිකුත් කරනු ලබන** සහතිකය
- පාසල් අයදුම්කරුවන් -අන්තර්ජාලය මගින් ලබාගත් ප්‍රතිඵල ලේඛනයේ **පාසලේ විදුහල්පති සහතික කරන ලද** පිටපත හෝ විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද **මුල් සහතිකයේ** සහතික කරන ලද පිටපත
- පෞද්ගලික අයදුම්කරුවන් - අන්තර්ජාලය මගින් නොව විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද **මුල් සහතිකයේ** සහතික කරන ලද පිටපත

10. අයදුම්පත සමග අධ්‍යාපන සහතිකවල සහ අනෙකුත් ලේඛනවල සහතික කළ පිටපත් පමණක් එවිය යුතුය. (මුල් පිටපත් එවීම අවශ්‍ය නොවේ.)

11. අන්තර්ජාලය මගින් ලබාගත් අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල ලේඛනය හැර අනෙකුත් අධ්‍යාපන සහතික සහ ලේඛනවල පිටපත් සහතික කළ යුත්තේ **රජයේ හෝ අනුමත කළ පාසලක ප්‍රධානියෙකු/ විශ්වවිද්‍යාල ආචාර්යවරයකු/නීතිඥවරයෙකු/ රජයේ දෙපාර්තුමේන්තුවක හෝ සංස්ථාපිත ආයතනයක විධායක නිලධාරියකු/ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ ග්‍රාම නිලධාරිවරයෙකු** විසිනි. එකී පිටපත්වල සහතික කරන නිලධාරියාගේ අත්සන සහ නිලමුද්‍රාව තිබීම අනිවාර්ය වේ.

---

❖ ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

❖ එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතු අතර අදාළ ගෙවීම් ද වෙන් වෙන් වශයෙන් අදාළ ගිණුම් අංකවලට ගෙවිය යුතුය. අදාළ නිර්ණායක සම්පූර්ණ කළ පසු එක් අයදුම්කරුවෙකුට ලියාපදිංචි විය හැක්කේ එක් බාහිර උපාධි පාඨමාලාවකට පමණි.

❖ එක් එක් උපාධි පාඨමාලාවන්ට නියමිත ගිණුම් අංකයට ගෙවීම් සිදු නොකර එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

***** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.***

නියෝජ්‍ය ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2024-07-23